සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය I

**නම/විභාග අංකය :- ..........................................................** **කාලය: පැය 01 යි.**

- සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01-40 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

(01) ඉස්ලාමීය අකීදාවහි පරලොව ජීවිතය හා සම්බන්ධ මහ්ෂර්, හිසාබ්, හවුල්, සිරාත්, යන ඇතුළත්වන කොටස,
(1) අර්රූහානියියාත් (2) අස්සම්ඉය්යාත් (3) අල් ඉලාහිය්යාත් (4) අන්නුබුව්වාත්

(02) මුස්ලිම් කෙනෙකු ඉටු කළ යුතු වගකීම් අතරින් "ඉබාදත්" සඳහන් වන්නේ,
(1) අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස ක්‍රියාකිරීම (2) පොළොව සංවර්ධනය කිරීම
(3) ෂරීආ නීති රීති ක්‍රියාකිරීම (4) අල්ලාහ්තආලාට යටහත්ව ක්‍රියාකිරීම

(03) අල්ලාහ්ගේ අලංකාර නම් අතරින් "අල් මු:ති" යනු,
(1) ස්ථාවරව සිටින්නා (2) ශක්තිවන්තයා (3) ලබාදෙන්නා (4) පොහොසත් කරන්නා

(04) යත්රිබ් ප්‍රදේශයට ඉස්ලාමය ඉගැන්වීමට පිටත්කළ සහාබිවරයා,
(1) මුස්අබ් ඉබ්නු උමෙර් (රලි) (2) මුආද් ඉබ්නු ජබල් (රලි)
(3) ජෙ:ෆර් ඉබ්නු අබීතාලිබ් (රලි) (4) අලි ඉබ්නු අබීතාලිබ්(රලි)

(05) "උම්මතන් වසතන්" යන වචනයෙන් හැඟවෙන්නේ,
(1) අන්තවාදී අදහස් ලැබූ සමාජය (2) මධ්‍යස්ථ සමාජය
(3) නිහඬවූ සමාජය (4) පරිත්‍යාගශීලි සමාජය

(06) ජලයෙහි කොටස් අතරින් "අල්මාඋත් තාහිර්" සඳහා නිදසුනක්,
(1) පොකුණු ජලය (2) මුහුදු ජලය (3) උල්පත් ජලය (4) පිණි දිය

(07) "තර්තීබ් තිලාවත්" යනු,
(1) අල්කුර්ආනය පාරායනය කරන ක්‍රමය (2) අල්කුර්ආන් පහවූ ක්‍රමය
(3) අල්කුර්ආන් ලිඛිත සටහන් කරගත් ක්‍රමය (4) අල්කුර්ආන් ආරක්ෂා කරන ලද ක්‍රමය

(08) සමාජය වහල් භාවයෙන් ආරක්ෂාකළ මූසා (අලෛ)තුමාගේ ඉතිහාසය සඳහන් කරන සූරාව,
(1) සූරා බකරා (2) සූරා කහ්ෆ් (3) සූරා අ:රාෆ් (4) සූරා මර්යම්

(09) “තවර්රුක්” යනු,

(1) පළමු අත්තහියියාත් හිදුම
(2) සලාතය සඳහා වූ සමාරම්භක තක්බීරය
(3) අවසන් අත්තහියියාත් හිදුම
(4) හජ් කාලයේ පවසන තල්බියා

(10) “ඉහ්ලාස්” යනු,

(1) රැකීම
(2) පිරිසිදු චේතනාව
(3) ඇල්මක් නොමැත් ජීවිතය
(4) ඉවසීම

(11) “තවක්කුල්” මගින් සඳහන් වන්නේ,

(1) ඇල්මක් නොමැතිව ජීවත් වීමය
(2) අල්ලාහ් වෙත තව්බා කිරීමය
(3) පිවිතුරු භාවයෙන් ක්‍රියාකිරීමය
(4) උත්සාහයෙන් පසු අල්ලාහ් වෙත පැවරීම

(12) තයම්මුම්හි අවයවයන් වන්නේ,

(1) මුහුණ සහ දෙඅත්ය
(2) මුහුණ සහ පාද දෙක
(3) මුහුණ සහ හිස
(4) මුහුණ, හිස සහ දෙඅත්

(13) “වමින් ෂර්රි හාසිදින් ඉසා හසද්” නම් වාක්‍යයෙන් අවසන් වෙන සූරාවෙහි නම ,

(1) සූරා ඉහ්ලාස්
(2) සූරා අන්නාස්
(3) සූරා කාෆිරූන්
(4) සූරා අලක්

(14) “ඉතා සුළු වශයෙන් හෝ ව්‍යාජ සිතැඟි තිබීම ආදේශ කිරීමකි” යනු,

(1) ඉමාම්වරුන්ගේ ප්‍රකාශනය
(2) තාබිඊන්වරුන්ගේ ප්‍රකාශනය
(3) හදීස් වදනකි
(4) අල්කුර්ආන් වදනකි

(15) ආජ්නබි වූ පිරිමියෙකු සමග කාන්තාවක් හුදකලාවේ සිටීම,

(1) හරාම් වේ
(2) ජාඉස් වේ
(3) හලාල් වේ
4)මක්රූහ් වේ

(16) හදීස් හි සඳහන් වන පරිදි මිනිසාගේ ආහාර සඳහා තමන්ගේ ආමාශයේ වෙන් කළ යුතු කොටස,

(1) 2/3
(2) 1/3
(3) 1/2
(4)1/4

(17) ප්‍රථමයෙන් පහළ වූ අල්අකුර්ආන්හි වාක්‍ය පහ ඇතුළත්වන සූරාව,

(1) අල්බකරා
(2) අල් අලක්
(3) අල් මුල්ක්
(4) අල් හෂ්ර්

(18) සලාතයෙහි අනිවාර්යයෙන් පාරායනය කළ යුතු පාරායනය,

(1) සූරා අල් ෆාතිහා
(2) වජ්ජහ්තු
(3) තස්බීහ්
(4) කුණූත්

(19) නූහ්(අලෛ)තුමා නිරත වූ රැකියාව,

(1) පේෂ කර්මාන්තය
(2) කෘෂිකර්මය
(3) වඩු කර්මාන්තය
(4) යකඩ කර්මාන්තය

(20) උසූලුල් ෆික්හ් කලාව ග්‍රන්ථාරූඪ කළ විද්වතා,

(1) ඉමාම් අබූහනීෆා(රහ්)
(2) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්)
(3) ඉමාම් මාලික්(රහ්)
(4) ඉමාම් ෂාෆිඊ (රහ්)

(21) ඊමාන් හි ඉතා උසස් ම තත්වය ලාඉලාහ ඉල්ලල්ලාහු වේ, එහි පහත්ම තත්වය වන්නේ,

(1) දෙමාපියන් වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම (2) මිනිසුන්ට හානි කරන දෙයක් පාරෙන් ඉවත් කිරීම

(3) ගුරුභවතුන්හට ගරු කිරීම (4) පතිවත රැකීම

(22) අල්අකුර්ආන්හි සඳහන් වන "ලෝක වැසියන්ගේ දායාදය" යනුවෙන් අදහස් කරන අරාබි වචනය,

(1) ෂෆීඋල් මුස්නිබීන් (2) සෙයිසිදුල් මුර්සලීන්

(3) සෙයිසිදුල් අන්බියා (4) රහ්මතුන් ලිල් ආලමීන්

(23) අධ්‍යාත්මික ක්‍රියාවන් හි තමන්ගේ දැඩි ස්ථාවරත්වය ඉවත් කර ගත් සහාබි,

(1) අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර්(රලි) (2) හාතිම් ඉබ්නු අබුබල් ද ආ(රලි)

(3) අම්රිබ්නුල් ආස්(රලි) (4) අබ්දුල්ලා ඉබ්නු උමර්(රලි)

(24) ඉමාම් අබුල්හසන් අෂ්අරී(රහ්), ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල්(රහ්) යන දෙදෙනා,

(1) තෆ්සීර් කලාව සම්බන්ධ විද්වතුන්ය (2) ෆික්හ් කලාව සම්බන්ධ විද්වතුන්ය

(3) අකීදා කලාව සම්බන්ධ විද්වතුන්ය (4) හදීස් කලාව සම්බන්ධ විද්වතුන්ය

(25) "අල්ලාහුස් සමද්" යන වචනයෙහි තේරුම ,

(1) අල්ලාහ් අවශ්‍යතාවන්ගෙන් මිදි කෙනා (2) අල්ලාහ් එක්කෙනාය

(3) නබි(සල්)තුමා හා සහාබාවරුන් පිළිපදින අය වේ (4) නීති ග්‍රන්ථ ගොනු කළ අය වේ

(26) "අහ්ලුස්සුන්නා වල් ජමා අත්" යනු,

(1) ඉමාම්වරුහතර දෙනාම පිළිපදින අය වේ (2) හදීස් ගොනුකළ අය වේ

(3) නබි(සල්)තුමා හා සහාභාවරුන් පිළිපදින අය වේ (4) නීති ග්‍රන්ථ ගොනු කළ අය වේ

(27) අරාබිකරයේ උතුරු මායිම වන්නේ,

(1) රතු මුහුද (2) සිරියා කාන්තාරය (3) පර්සියාව 4)අරාබි මුහුද

(28) ඊජාබ් - කබූල් යන පදයන් භාවිත කරන වෙනත් අවස්ථාවක්,

(1) ගිවිසුමකදී (2) දඬුවමක දී (3) දික්කසාදයේ දී (4)ව්‍යාපාර කටයුතු වලදී

(29) "සුබ්හානල්ලාහ්" යන පදයෙහි තේරුම,

(1) සියලුම ප්‍රශංසා අල්ලාහ්ටය (2) අල්ලාහ් අති ශ්‍රේෂ්ඨ වේ

(3) අල්ලාහ් පාරිශුද්ධවන්තයා වේ (4) සියලුම පාලනය අල්ලාහ්ට වේ

(30) ආගම සහ සුහුෆ් ලැබූ නබිවරයා,

(1) මූසා(අලෛ) (2) දාවූද්(අලෛ) (3) ඊසා(අලෛ) (4) ඉබ්රාහිම්(අලෛ)

(31) ෆර්ල් කිෆායා සඳහා නිදසුනකි,

(1) උපවාසය වේ (2) පස්වේල් සලාතය වේ

(3) පවුල නඩත්තු කිරීම වේ (4) සමාජයට අවශ්‍ය විද්වතුන් නිර්මාණය කිරීම වේ

(32) කියාස් හි අර්කාන් අතරින් “ෆර්උ” යනු,

(1) පොදු ගුණාංග (2) නවක ගැටළුව
(3) තීරණය (4) සසඳා බැලීම

(33) පහත සඳහන් සලාතය මගින් කෙනෙකුට ලැබෙන ආධ්‍යාත්මික ප්‍රයෝජනයන්හි එකක්,

(1) ශරීරය හා ඇඳුම පිරිසිදු කිරීම (2) කාලය කළමණාකරනය ලබා ගැනීම
(3) නායකත්වයට යටහත් වීමට පුරුදුව ලැබීම (4) දේව භාග්‍ය ලැබීම

(34) ජාහිලිය්‍යා යුගයේ ෂිර්ක් කටයුතු වල සම්බන්ධ නොවූ අය සඳහන් කරන අරාබි පදය,

(1) අසබිස්සා (2) හනීෆ්වරු (3) කබීලා (4) මුද්ආ

(35) ස්නානය අනිවාර්ය වූ කෙනෙකු ජලය භාවිත කිරීමට නොහැකි නිසා සලාතය වේලාවට ඉටු කිරීමට ප්‍රතික්ෂේප කරති. එම පුද්ගලයාට ඔබ පවසන මග පෙන්වීම වන්නේ,

(1) සලාතය අත්හැරීමට ඔබට හැකිය (2) ඔබ පසුව සලාතය කළ යුතුය
(3) ඔබ තයම්මුම් කර සලාතය ඉටු කළ යුතුය
(4) ඔබ ස්නානය කර අනිවාර්යයෙන් සලාතය වහාම ඉටු කළ යුතුය

(36) තිදෙනෙකුගේ ඇස් අපාය නොදකී, එයින් එකක් අල්ලාහ් විසින් තහනම් කළ දෙය නොබැලූ ඇස්, අනිත් දෙකකින් එකක් වන්නේ,

(1) අල්ලාහ්ගේ යහමගට නිදි මැරූ ඇස් (2) ස්වර්ගය දැකීමට ආසා වූ ඇස්
(3) නබි(සල්)තුමාව දැකීමට ආසා වු ඇස් (4) අවසන් දිනයේ අල්ලාහ්ව දැකීමට ආසා වූ ඇස්

(37) වර්ථමානයේ හිජ්රි වර්ෂය,

(1) 1440 (2) 1442 (3)1443 (4) 1441

(38) මා කවුද? කොහි සිට පැමිණියෙමි ද? යන්නේ කොයි දෙසට ද? යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර ලබා දෙන්නේ,

(1) ඉන්ද්‍රීය ඥානය (2) විචක්ෂණ ඥානය (3) වහී දැනුම (4) විද්‍යාත්මක දැනුම

(39) අල්කුර්ආන් ගොනු කිරීමේ කටයුතු වලදී කලීෆා අබුබක්කර්(රලි), කලීෆා උස්මාන්(රලි)තුමන්ගේ කාල වකවානුවලදී නායකත්වය ලබාදුන් සහාබිවරයා වන්නේ,

(1) සෙද්බින් සාබිත්(රලි) (2) හුදෛෆතුල් යමානි (රලි)
(3) මුආවියා බින් අබිසුෆ්යාන් (4) අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස්(රලි)

(40) පහත සඳහන් වන අල්ලාහ්ගේ අලංකාර නම් කිහිපයකි,

| අ | ආ |
|---|---|
| (1) සදා ජීවමාන | A - අල් කයියුම් |
| (2) උත්තරීතරවන්නා | B - අල් අලිය්‍යු |
| (3) උත්කෘෂ්ඨවන්නා | C - අල් අලීම් |
| (4) සදාකාලිකව සිටින්නා | D - අල් හය්‍යු |

ඉහත “අ” “ආ” සඳහා ගැලපෙන පිළිතුර වන්නේ,

(1) ACBD (2) ACDB (3) BADC (4) DCBA

(ලකුණු 1 ×40 = 40 )

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය II

**නම/විභාග අංකය :- ........................................................** **කාලය: පැය 02 යි.**

◆ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

◆ පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද වෙනත් එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(1) ඉස්ලාමීය අකීදාවට පටහැනිවූ කණ්ඩායම් දෙකක් සඳහන් කරන්න.

(2) සුන්නත්වූ ක්‍රියාවන් දෙකක් සඳහන් කරන්න.

(3) තව්බා පිළිගැනීමට අවශ්‍ය කොන්දේසීන් අතර දෙකක් සඳහන් කරන්න.

(4) ඉජ්මාහි ප්‍රධාන කොටස් දෙකක් සඳහන් කරන්න.

(5) ජාහිලිය්යා යුගයේ වෙළඳ පොළවල්හි සිදුවූ තරඟයන් දෙකක් සඳහන් කරන්න.

(6) ඉපැයීම ඉබාදත් වීමට අවශ්‍ය මගපෙන්වීම් දෙකක් සඳහන් කරන්න.

(7) මිනිස් අයිතිවාසිකම් සම්බන්ධ ගිවිසුම් දෙකක් නම් කරන්න.

(8) මුතනබ්වරු, මුර්තද්වරු යන පද දෙක අතර තිබෙන වෙනස්කම සඳහන් කරන්න.

(9) කෘෂිකර්මයේ කොටස් දෙක කුමක් ද?

(10) සුජූද්හි පාරායන කළ යුතු පාරායනය ඔබගේ භාෂාවෙන් ලියන්න.

(ලකුණු 2×10 =20)

(02) (1) ඉස්ලාමීය අකීදාවට පදනම් වන මූලාශ්‍රයන් කුමක් ද?

(2) ෂීද්(අලෛ), ඉද්රීස්(අලෛ), ඉබ්රාහිම්(අලෛ)තුමානන්හට හිමිවූ සුහුෆ් ගණන සඳහන් කරන්න.

(3) මිනිස් සමාජයට මගපෙන්වීම සඳහා රිසාලත් අවශ්‍යවීමට හේතු කාරණාවන් පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 =10)

(03) (1) නජීස් හි කොටස් අතරින් කොටස් දෙකක් සඳහන් කරන්න.

(2) සුබහ් සලාතයෙන් පසුව පාරායනය කිරීම සඳහා නබි(සල්)තුමා ඉගෙන් වූ දුආවන් තුනක් ඔබේ භාෂාවෙන් සඳහන් කරන්න.

(3) මක්කා කාලවකවානුවේ නබි(සල්)තුමා මුහුණ දුන් අභියෝගයන් පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 =10)

(04) (1) සිත හා බැඳුනු ඉබාදතයන් දෙකක් සඳහන් කරන්න.

(2) අල්අකුර්ආනය පැහැදිලි කරන සිතහි කොටස් කෙටියෙන් විස්තර කරන්න.

(3) සිතෙහි වැදගත්කම සම්බන්ධව හදීසයක් ද, මානසික යෝග්‍යතාවය වර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම් තුනක් ද ඉදිරිපත් කරන්න.

(ලකුණු 2+3+5 =10)

(05) (1) වහී හි කොටස් නිදසුන් සමග සඳහන් කරන්න.

(2) සුන්නාහ්ව ආරක්ෂා කිරීමට විද්වතුන් මගින් සිදු කරන ලද උත්සාහයන් තුනක් සඳහන් කරන්න.

(3) තරුණයෙකු හෝ තරුණියක් තමන්ව පාප ක්‍රියාවන්වලින් ආරක්ෂා කර ගැනීමට පිළිපැදිය යුතු යනුවෙන් ඉස්ලාම් ධර්මයේ සඳහන් කරන මඟපෙන්වීම් පහක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2+3+5 =10)

(06) (1) නබි (සල්)තුමාගේ මක්කා කාල දඃවා කටයුතු සඳහා සහයෝගීව සිටි හතර දෙනෙකු නම් කරන්න.

(2) නබි (සල්)තුමා හට ප්‍රථම වහි පහළ වූ සිද්ධිය කෙටියෙන් සඳහන් කරන්න.

(3) ඉපැයීමේදී පිළිපැදිය යුතු ෂරිආවෙහි නීති රීතීන් පහක් විස්තර කරන්න.

(ලකුණු 2+3+5 =10)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

(1) ජීවිතය ඉබාදතයකි.

(2) ඉපයීමේ වැදගත්කම.

(3) දන්දීමේ ප්‍රයෝජන.

(4) පිරිසිදුකමේ වැදගත්කම.

(ලකුණු 5+5 =10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය - පිළිතුරු

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (11) | 4 | (21) | 2 | (31) | 4 |
| (02) | 4 | (12) | 1 | (22) | 4 | (32) | 2 |
| (03) | 3 | (13) | 4 | (23) | 1 | (33) | 4 |
| (04) | 1 | (14) | 3 | (24) | 3 | (34) | 2 |
| (05) | 2 | (15) | 1 | (25) | 1 | (35) | 3 |
| (06) | 4 | (16) | 2 | (26) | 3 | (36) | 1 |
| (07) | 1 | (17) | 2 | (27) | 2 | (37) | 2 |
| (08) | 3 | (18) | 1 | (28) | 4 | (38) | 3 |
| (09) | 3 | (19) | 3 | (29) | 3 | (39) | 1 |
| (10) | 2 | (20) | 4 | (30) | 1 | (40) | 4 |

(ලකුණු 1 × 40 = 40)

### II කොටස

(01) (1) මු:තසිලා, කදරිය්‍යා, මුර්ජිආ, ජබරිය්‍යා

(2) සුන්නතන් වූ සලාතයන්, දික්ර්, සලාම් පැවසීම, රෝගීන් සුවදුක් බැලීම

(3) 1. පිවිතුරු චේතනාවෙන් කම්බා කිරීම.
2. පාපකර්මයෙන් සහ මුලින්ම ඉවත් කිරීම.
3. නැවත නොකරන බවට අධිෂ්ඨාන කර ගැනීම.

(4) ඉජ්මාඋස්සරීහ්, ඉජ්මාඋල් අක්සරිය්‍යා, ඉජ්මාඋස්සුකූති

(5) කවි තරඟ, මල්ලව පොර තරඟ

(6) පිරිසිදු චේතනාව, ෂරියාවෙහි අනුමැතිය, ෂරිආ සීමාවන් ඉක්මවා නොයෑම

(7) මදීනා සාසනය, මක්නා කාටා

(8) මුතනබ්බිවරු - ව්‍යාජ නබිවරුන්
මුර්තද්වරු - ආගම් වෙනස්කරුවන්

(9) 1. ශාක ආහාර ලබා ගැනීම සඳහා වූ බෝග වගාව.
2. මාංශ ආහාර ලබා ගැනීම සඳහා වූ සත්ත්ව පාලනය.

(10) සුබ්හාන රබ්බියල් අ:ලා වබිහම්දිහි

(ලකුණු 2 × 10 = 20)

(02) (1) අල් අකුර්ආන්, අස්සුන්නාහ් (ලකුණු 2)

(2) ෂීද්(අලෛ) - 50
ඉද්රීස්(අලෛ) - 30
ඉබ්රාහීම්(අලෛ) - 10 (ලකුණු 3)

*මිනිසා මවනු ලැබූ අරමුණු දැන ගැනීමට

*මිනිසා යහමඟ යෑමට

*මිනිස් ජීවිතයට මඟ පෙන්වීමට (ලකුණු 5)

(03) (1) සාමාන්‍ය නජීස්

මෘදු නජීස්

දැඩි නජීස් (ලකුණු 2)

(2) *හතරවැනි කලිමාව - ලාඉලාහ ඉල්ලල්ලාහු

*අල්ලාහුම්ම අජිර්නි මිනන්නාර්

*අල්ලාහුම්ම ඉන්නී අස් අලුක ඉල්මන් නාෆිඅන් වරිස්කන් හලාලන් තය්යිබන් වඅමලන් මුතකබ්බලා (ලකුණු 3)

(3) (1) සමාජ නායකයන්ගේ අභියෝගයන්ට මුහුණ දීමට සිදුවීම

(2) පහත් වචන භාවිතා කර තර්ජනය කිරීම (හූනියම් කාරයා, පිස්සා)

(3) ශාරීරික වද හිංසා වලට පත් කළහ

(4) නබිතුමාව පිළිගත් අයද වද හිංසා වලට පත් කළහ

(5)ෂිඃබු අබිතාලබ්හි සිරගතකර තැබීම (ලකුණු 5)

(04) (1) ඉඛ්ලාස් , ඉවසීම (ලකුණු 2)

(2) නෆ්සුල් අම්මාරා බිස්සු :- අයහපතට පොළඹවන සිත

නෆ්සුල් ලව්වාමා :- තමාව රිදවා ගන්නා සිත

නෆ්සුල් මුත්මඉන්නා :- තෘප්තිමත් සිත (ලකුණු 3)

(3) "නියත වශයෙන්ම ශරීරයෙහි එක් මස් පිඬක් ඇත. එය අයහපත් වුයේ නම්, මුළු ශරීරයම අයහපත් වේ. එය යහපත් නම් මුළු ශරීරයම යහපත් වේ. එය සිත වේ". (බුහාරි මුස්ලිම්)

*සැමදා අල්ලාහ් සිහිපත් කිරීම

*දික්ර්, දුආ, ඉස්තිඃෆාර් කිරීම

*රාත්‍රී නැමඳුම් වල නිරත වීම

*මුහාසබා කිරීම (ලකුණු 5 )

(05) (1) වහි මත්ලුව් - අල්අකුර්ආන්

වහි ගෛරු මත්ලුව් - අල්හදීස් (ලකුණු 2)

(2) *හදීස් විද්වතුන් හදීස් දැනගැනීමට විවිධ උත්සාහයන් වල නිරත වීම

*හදීස් ග්‍රන්ථ සකස් කිරීම

*හදීස් ඉගැන්වීම සඳහා ස්ථාන පිහිටවීම

*සත්‍ය හදීස් වෙන් කර තබා ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙලවල් කිරීම (ලකුණු 3)

(3) *ආධ්‍යාත්මික කටයුතු වල නිරත වීම (දික්ර්, තව්බා, තිලාවාතුල් කුර්ආන්)

*වැරදි මිත්‍රත්වයෙන් වැළකී සිටීම

*ඉස්ලාමීය මඟපෙන්වීම් පිළිගෙන ජීවත් වීම

*අජ්නබී, මහ්රම්

*යහපත් අය සමඟ ආශ්‍රය කිරීම

*දිනපතා ව්‍යායාම් වල  නිරත වීම

*යහපත් ආහාර පාන ලබා ගැනීම (ලකුණු 5)

(06) (1) අබුතාලිබ්, කදීජා(රලි), අලි(රලි), අබුබක්කාර්(රලි), හම්සා(රලි), උමර්(රලි), අර්කම්(රලි) (ලකුණු ½×4 =2)

(2) *නබි(සල්)තුමාට අවුරුදු 40 දී හිරා ගුහාවේ සිටින විට ප්‍රථම වහී පහළ විය.

*ජිබ්රිල්(අලෛ)තුමා පැමිණ "ඉක්රඃ" යනුවෙන් පවසන විට නබිතුමා මා හට කියවන්න දන්නේ නැත යනුවෙන් පැවසුහ.එවිට ජිබ්රීල්(අලෛ)තුමා නබිතුමාව තදින් අල්ලාගෙන පැවසූ විට නබිතුමා ඉක්රඃ යනුවෙන් පැවසුහ. මෙම අවස්ථාවේ දී සූරා අලක් හි මුල් ආයතයන් පහ පහළ විය. (ලකුණු 3)

(3) (1) හරාම් වූ දෑ අඩංගු භාණ්ඩයක් නොවිය යුතුය.

(උදා: මත්ද්‍රව්‍ය, ඌරු මස්, සොරකම් කරන ලද භාණ්ඩ)

(2)හරාම් වූ ක්‍රියා මඟින් ලබාගත් දෙයක් නොවිය යුතුය.

(උදා: සොරකම්, පොළිය, අල්ලස්)

(3) ජනතාවට හිරිහැරයක් හෝ රැවටීමක් වන දෙයක් නොවිය යුතුය.

(උදා: සඟවා තැබීම, මිශ්‍ර කිරීම, පොරොන්දු කඩ කිරීම)

(4)පොදු නීති උල්ලංඝනය කිරීමේ ක්‍රියාවක් නොවිය යුතුය.

(උදා: කළුකඩ, භාණ්ඩ පැන්නීම)

(5)යහපත් සාරධර්ම වලට පටහැනි නොවිය යුතුය.

(උදා: බොරු, තණ්හාව, වංචා, ආත්මාර්ථකාමීත්වය) (ලකුණු 5)

(07) (1) ජීවිතය ඉබාදතකි:

*ජීවිතය ඉබාදත් කිරීමට ඉස්ලාම් මග පෙන්වා ඇත.

*මුස්ලිම් කෙනෙකුගේ ජීවිතයම ඉබාදත් විය යුතුය.

*ඉබාදත් වීමට අදාළ කොන්දේසීන් ලබා දී ඇත.

*ඉබාදත් නිසා මෙලොව හා පරලොව ජීවිතය ඉතා සාර්ථක වේ. (මෙවැනි කරුනු 5ක් ලියා ඇත්නම්) (ලකුණු 5)

(2) ඉපැයීමේ වැදගත්කම:

*ඉපයීමට අදාළ මඟපෙන්වීම් ඉස්ලාම් ලබා දී ඇත.

*නබිවරුන් ද ඉපැයීම් වල නිරත වී ඇත.

*සිගමන් යැදීම අල්ලාහ් අප්‍රිය කරන ක්‍රියාවකි.

*ඉපැයීම ඉස්ලාම් හි ඉබාදතයකි.

*ඉපැයීම මුස්ලිම් කෙනෙකුගේ අනිවාර්ය ක්‍රියාවකි. (මෙවැනි කරුනු 5ක් ලියා ඇත්නම්) (ලකුණු 5)

(3) දන්දීමේ ප්‍රයෝජන

*අල්ලාහ්ගේ ආදරය හා කරුණාව ලැබීම.

*දන්දීම අල්ලාහ්ගේ ගුණාංගයකි.

*දන්දීමෙන් අපේ සම්පත් වර්ධනය වේ.

*ලෝබකම තුරන් වේ.

*කියාමාවෙන් මහඟු භාග්‍යයන් ලැබේ. (මෙවැනි කරුනු 5ක් ලියා ඇත්නම්) (ලකුණු 5 )

(4) පිරිසිදුකමේ වැදගත්කම

*පිරිසිදුකම රකින ලෙසට ඉස්ලාම් දැඩිව අවවාද කරති.

*ඉස්ලිමීය කටයුතු හා වගකීම් සියල්ල පිරිසිදුව තිබේ.

*පිරිසිදුකම ඊමානයේ කොටසකි.

*පිරිසිදුකම නොමැති කෙනාහට ඉස්ලාම්හි ඉඩක් නොමැත.

*අල්ලාහ් පිරිසිදුවෙන් සිටින අයට කැමතිය. (මෙවැනි කරුනු 5ක් ලියා ඇත්නම්) (ලකුණු 5)